# වත්තල ප්‍රාදේශීය සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණත් ඒ අනුව ස්ථාවර වත්කම් ගිණුම් ගලපා නොතිබුණි. .

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී කඩා ඉවත්කරන ලද ඉද්දමල්වත්ත ප්‍රජාශාලාව ඉඩම් හා ගොඩනැගිලි යටතේ පෙන්වීම නිසා රු.64,339කින් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි උපලේඛනයේ දක්වා ඇති ඉඩම් 10 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ස්ථානගතකර ඇති රුපියල් ලක්ෂ 48 ක් වටිනා විදුලි උත්පාදන යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත්කර නොතිබුණි.

1.3.3 **නොසැසඳුණු ගිණුම්**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් අයිතම 06 ක ශේෂයන් හා ඒවාට අදාල උපයෝගි ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.66,551,608 ක වෙනසක් විය.

(ආ) ඉදිරිපත් කල ගිණුම් අනුව 2017 දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා තොග ශේෂය රු.4,438,025 ක් වූ නමුත් එදිනට තොග සත්‍යාපන වාර්තා අනුව ශේෂය රු.3,052,292 ක් වූයෙන් රු.1,385,733 ක වෙනසක් විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

දික්ඕවිට ජීවවායු ඒකකයට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් බඳවාගත් ආරක්ෂක නිලධාරීට වැටුප් ලෙස 2012 ඔක්තෝබර් මස රු.25,000 ක් සභාවෙන් ගෙවා තිබුණද 2018 අප්‍රේල් 12 දින වන විටත් එම ආයතනයෙන් මුදල් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

(i) 2016 වර්ෂයේ හිඟ වරිපනම් එකතුකිරීම වෙනුවෙන් ගෙවිය යුතු කොමිස් මුදල් ලෙස නම් කළ නිලධාරීන් දෙදෙනෙකුට වෙන් කළ රු.157,012 ක් ගෙවා නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු රු.64,774 ක මුදලක් නිරවුල් කර නොතිබුණි.

(iii) ජල කර්මාන්ත ගබඩාව ලෙස නම් කරන ලද හඳුනා නොගත් රු.729,708 ක ශේෂයක් 2008 වර්ෂයේ සිට නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.3.5 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

ශේෂ සනාථ කිරීම් හා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.149,364,875 ක්වූ ගිණුම් ශේෂ 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219 වගන්තියට අනුකූල නොවන පරිදි සභාවේ සභිකයකුගේ භාර්යාවකට උත්සව ශාලාව බදු දී තිබූ අතර 2009 මැයි 30 දින සිට එම උත්සව ශාලාවෙන් රු.774,800 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.78,739,806 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.80,472,115 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

සභා අරමුදල් උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව ප්‍රදේශයේ ජනතාවට වැයකිරීම සභාවේ අරමුණ වුවද, ස්ථාවර තැන්පතු 36 ක රු.මිලියන 144.1 ක මුදලක් ආයෝජනය කර තිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 75,300,000 | 80,694,386 | 91,680,253 | 66,553,360 | 77,850,000 | 79,874,262 | 98,345,136 | 77,539,227 |
| කුලී | 5,372,100 | 4,714,085 | 4,897,709 | 6,545,445 | 5,026,500 | 5,544,477 | 6,234,084 | 6,729,069 |
| බලපත්‍ර ගාස්තු | 3,225,000 | 3,978,855 | 5,022,660 | - | 3,410,000 | 3,488,963 | 3,690,423 | 1,043,805 |
| වෙනත් ආදායම් | 240,215,500 | - | 241,905,893 | - | 203,982,500 | - | 249,769,417 | - |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

පූර්ව වර්ෂයේ රැස්කළ ආදායම රු. මිලියන 358.03 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු. මිලියන 343.50 දක්වා රු. මිලියන 14.53 කින් අඩුවී තිබුණි.

2.3.3 **වරිපනම් හා බදු**

2017 දෙසැම්බර් 31 දිනට රු.66,553,360 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 1 සිට වසර 5 දක්වා රු.36,994,450 ක්, වසර 5 සිට වසර 10 දක්වා රු.14,418,036 ක් හා වසර 10 ට වැඩි රු. 15,140,874 ක් ද ඇතුළත් වූ අතර, මෙම ආදායම් අයකර ගැනීමට සභාව විසින් ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබුණි.

2.3.4 **කඩකුලී**

කෙරවලපිටිය වෙළඳ සංකීර්ණයේ කඩකාමර 27 කින් රු.4, 139,748 ක කඩ කුලියක් 2012 වසරේ සිට හිඟව තිබූ අතර එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 **බලපත්‍ර ගාස්තු**

වෙළඳ ස්ථාන හිමියන්ගෙන් මුදල් ලබාගෙන රිසිට්පතක් නිකුත් කර තිබූ නමුත් වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබූ අවස්ථා කිහිපයක් අනාවරණය විය.

2.3.6 **වෙනත් ආදායම්**

(අ) **පරිසර බලපත්‍ර**

සභා බල ප්‍රදේශයේ පවතින ලී මෝල්, යාන්ත්‍රික වඩු මඩු, නිවාඩු නිකේතන, ඉන්ධන පිරවුම්හල්, ඇඹරුම්හල්, මුද්‍රණාල, තෙල් මෝල් හා උත්සව ශාලා ඇතුළුව අනෙකුත් ව්‍යාපාර ආයතන අනිවාර්යයෙන්ම පරිසර බලපත්‍ර ලබා ගත යුතු වුවද, බල ප්‍රදේශයේ පිහිටි ආයතන 05 ක් පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ආ) **දැන්වීම් පුවරු ආදායම**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122 හා 126 වගන්ති හා 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 01 වන උප ලේඛනය ප්‍රකාරව සභා බලසීමාවට අයත් ප්‍රදේශයේ ඇති සියළුම දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකළයුතු වුවද, දැන්වීම් පුවරු දහයකින් ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) **සම්ප්‍රේෂණ කුළුණු ආදායම**

(i) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමත ලැයිස්තුව අනුව ස්ථාපිත කර ඇති සභා බල ප්‍රදේශයට අයත් දුරකථන කුළුණු සියල්ල හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ V වන උපලේඛනයේ V වන වගන්තිය ප්‍රකාරව ආදායම එකතු කර ගත යුතු වුවත්, වැලිසර උප කාර්යාල බල ප්‍රදේශයේ තිබෙන දුරකථන කුළුණුවලින් ආදායම් කිසිවක් එකතු කර නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණුවල සවිකරන ලද තරංග හුවමාරු උපකරණ අයත් ආයතනවලින් ව්‍යාපාර බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙලකර තිබුණත් 2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් වූ ක්‍රියාකාරකම් 04 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) <u>අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.</u>

හැඳල උප කාර්යාලයට අයත් කඩකාමර 08 ක් 2007 වර්ෂයේ සිට අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත්කර ගැනීමකින් තොරව පැවතුණි.

(ඈ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(i) 2008 ජූලි 30 දින අංක 1560/06 දරන ගැසට් පත්‍රයේ 18 (1) පරිදි වාර්ෂික අයවැය ලේඛනයේ කසල දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා ගාස්තු නියමකර නොතිබුණි.

(ii) ඉහත සඳහන් ගැසට්පත්‍රය හා 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව කසළ බදු හෝ ගාස්තු පනවා නොතිබුණි.

(ඉ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් සභාව විසින් පහත සඳහන් ව්‍යාපෘති සිදුකර තිබුණි.

(i) පළාත් පාලන ආයතන බලප්‍රදේශය තුල පදිංචිකරුවන්ගේ දිළිඳුකම පිටුදැකීම වෙනුවෙන් ස්වයංරැකියා වැඩසටහනක් ලෙස අඩුආදායම්ලාභී පවුල් 25 කට 2017 මැයි 26 හා ජූනි 09 දින වල පාවහන් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදී දෙසැම්බර් 08, 09 හා 10 දින වල සභා භූමිය තුල පාවහන් අලෙවිපොළක් ද පවත්වා තිබුණි. මේ සඳහා රු.150,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී වැයකර තිබුණි.

(ii) සභා අරමුදල් වලින් රු.7,500 ක් වැය කරමින් රුක් රෝපණය හා ගෙවතු වගාව පිළිබඳව වැඩසටහනක් 2017 වර්ෂයෙහි ක්‍රියාත්මක කර තිබුණි.

(iii) අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන්ට පාවහන් ලබාදීම සඳහා රු.392,974 ක් වැයකර තිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

2012 සිට 2014 දෙසැම්බර් දක්වා මිලයට ගත් භාවිතා නොවන ගබඩා භාණ්ඩ තොගයක් ගබඩාවේ තිබූ අතර එවන් භාණ්ඩ හඳුනාගෙන ගබඩාවෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 | - |
| තෘතීයික | 01 | 01 | - |
| ද්විතීයික | 59 | 54 | 05 |

| | | | |
|---|---|---|---|
| ප්‍රාථමික | 142 | 116 | 26 |
| රා.ප.ච. 25/2014 අනුව | 47 | 46 | 01 |
| | ---- | ----- | ------ |
| | 251 | 219 | 32 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුස්තකාලයාධිපති තනතුරක් , ආදායම් පරිපාලක තනතුරු 03 ක්, ළදරු පාසල් ගුරු තනතුරක්, රියදුරු තනතුරු 06 ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 07 ක්, වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 09 ක් සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 03 ක් පුරප්පාඩු වී තිබුණි.

(ආ) වර්ෂ 15 කට අධික කාලයක සිට අයනොවී පවතින රු.94,380 ක සේවක ණය ශේෂයක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සභාවට අයත් උපකාර්යාල තුනෙහිම වරිපනම් දේපල 2008 වර්ෂයේ තක්සේරු කර වර්ෂ 9 ක් පමණ ගතවී තිබුණු බැවින් දේපළවල වර්තමාන අගය පදනම් කරගෙන තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකර ගැනීමට සභාව අපොහොසත්වීම නිසා සභා බල ප්‍රදේශයේ දේපල ඒකක 57,113 කින් අයකළහැකි යාවත්කාලීන බදු ප්‍රමාණය අයකරගත නොහැකිවී තිබුණි.

3.5 **වත්කම් කළමනාකරණය**

3.5.1 **වත්කම් ලේඛනගත නොකිරීම.**

මූල්‍ය ප්‍රකාශනවල යතුරුපැදි 03 ක් වශයෙන් දක්වා තිබුණද භෞතික වත්කම් පරීක්ෂාවේදී යතුරුපැදි 02 ක් පමණක් තිබුණි.

3.5.2 **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම.**

සභාව සතු කැබ් රථයක් සහ අත්ට්‍රැක්ටරයක් වාහන අංගනය තුල දිරාපත් වෙමින් දීර්ඝ කාලයක සිට තිබෙන බව නිරීක්ෂණය වූ අතර එම වාහන සුදුසු පරිදි අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5.3 **පවරා නොගත් වත්කම්**

සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවලට අදාලව ඔප්පු හෝ පැවරුම් නියෝග හා පිඹුරුපත් ලබාගෙන නොතිබූ දේපල 19 ක් හා දේපළෙහි අයිතිය නිරවුල් කරගෙන ඔප්පු සකස්කර නොමැති ඉඩම් 30 ක් හැඳල උප කාර්යාලයේ ද, එවැනි දේපළ 27 ක් වැලිසර උප කාර්යාලයේ හා 16 ක් පමුණුගම උප කාර්යාලයේ තිබුණි.

3.5.4 **වත්කම් අන්සතු කිරීම**

1988 වර්ෂයේදී අගරදගුරු හිමිපාණෝ විසින් රු. 188,000 වටිනාකමක් මත තෑගි ඔප්පුවකින් වත්තල ප්‍රාදේශීය සභාවට පිරිනමන ලද අක්කර 11 රූඩ් 02 පර්චස් 11 ක් විශාල උස්වැටකෙයියාව පාර්ස් වත්ත ඉඩම, 1991 වර්ෂයේදී ඉඩම් කොටස් 57 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට බෙදා තෑගි ඔප්පු මගින් ඉඩම අන්සතුකර තිබුණි.

3.5.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව ප්‍රධාන කාර්යාලයේ තිබුණි.

(ආ) වටිනාකම හඳුනාගත නොහැකි සභාව සතු වසර 08 ක් පමණ පැරණි වාහන 05 ක් අභාවිතව තිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (ඒ) සහ (සී) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙලකර නොතිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**අයවැය පාලනය**

ව්‍යාපෘති 06 ක් සඳහා ඇස්තමේන්තුගත රු.49,500,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

5. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | යාවත්කාලීනව දේපළ තක්සේරු නොකිරීම. |
| | | (ii) | හිඟ ආදායම් එකතු කිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | නව ආදායම් ප්‍රභවයන් හඳුනාගෙන ආදායම් රැස් නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | (i) | ඇස්තමේන්තුගත මූල්‍ය ප්‍රතිපාදන භාවිතා නොකිරීම. |
| | | (ii) | අධි වෙන්කිරීම් තිබීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | හිමිකම් ඔප්පු ලබා නොගැනීම. |
| | | (ii) | වත්කම් පිළිබඳ ලේඛන පවත්වා නොගැනීම. |
| | | (iii) | පිරිවැය නොමැති ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ එකතු කිරීම හා බැහැර කිරීම පිළිබඳව ජනතාව දැනුවත් නොකිරීම. |
| | | (ii) | කසළ බදු අය නොකිරීම. |